සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 11 - 2023

# නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ඇඳීමේ පුවරුවේ සම්මත දාරයට නිවැරදිව තබන ලද T රූලක් මගින් වඩාත් පහසුවෙන් හා නිවැරදිව ඇඳිය හැකි රේඛාව වන්නේ,

(1) තිරස් රේඛාව (2) සිරස් රේඛාව (3) වක්‍ර රේඛාව (4) ආනත රේඛාව

02. ආධාරක රේඛාවක් ඇඳීම සඳහා වඩාත් සුදුසු පැන්සල් වර්ගය කුමක්ද?

(1) HB (2) 2H (3) B (4) BB

03. සැඟි දාරයක් දැක්වීම සඳහා භාවිතා කරන සම්මත රේඛාව හඳුන්වන නම,

(1) සිහින් දාම රේඛාව (2) කඩ රේඛාව
(3) ඝන අඛණ්ඩ රේඛාව (4) සිහින් අඛණ්ඩ අවිධි රේඛාව

04. A4 කඩදාසියක සම්මත මිම් වන්නේ,

(1) 210 x 148 mm (2) 105 x 74 mm (3) 297 x 210 mm (4) 594 x 420 mm

05. කේතුවක් එහි අක්ෂයට ලම්භකව කැපීමෙන් ලැබෙන වක්‍රයේ හැඩය,

(1) වෘත්තයකි. (2) ඉලිප්සයකි. (3) පරාවලයකි. (4) බහුවලයකි.

06. වඩිම්බු ලෑලි සඳහා වඩාත් යෝග්‍ය දැවය වන්නේ,

(1) තේක්ක (2) ගිනිසපු (3) බුරුත (4) කොස්

07. කපරාරු පෘෂ්ඨයක මතුපිට සම මට්ටමට ගෙන ඒමට අවශ්‍ය වන උපකරණයකි.

(1) කම්බි බුරුසුව (2) තලනය (3) මනිස් ලෑල්ල (4) අත් බදාම ලෑල්ල

08. තහඩුවල කාණු සකස්කර ගැනීමේදී වඩාත් යෝග්‍ය මිටිය කුමක්ද?

(1) අඬු මිටිය (2) බෝල පෙති මිටිය (3) අත කොලුව (4) ඉදිපෙති මිටිය

09. දව මූට්ටු කිරීමේදී ඊට අදාළ හේත්තු කපා ගැනීමට වඩාත් යෝග්‍ය කියත ලෙස සැලකිය හැක්කේ,

(1) ලෝහ කියත (2) බණ්ඩි කියත (3) තහඩු කියත (4) අත් කියත

10. දැවයක තරමක් විශාල සිදුරක් සකස්කර ගැනීම සඳහා අතීතයේදී බොහෝ විට භාවිතයට ගෙන ඇත.

(1) අවගාරය (2) අත් විදුම් යන්ත්‍රය (3) දුනු කියත (4) පීර

11. ගඩොල් නිපදවීමට ගනු ලබන මැටිවල තිබිය යුතු වැලි සංයුතිය,

(1) 20 - 30 % අතර (2) 30 - 40 % අතර

(3) 25 - 50 % අතර (4) 20 - 40 % අතර

12. තේක්ක දැවයෙහි වර්ණය,

(1) කහපාට වේ. (2) කළු පාට වේ. (3) ලා දුඹුරු පාට වේ. (4) ලා කහපාට වේ.

13. යම් ද්‍රව්‍යයකට තාපය ලබාදීම හේතුවෙන් එම ද්‍රව්‍ය ද්‍රව බවට පත්වීමට ඇති හැකියාව හඳුන්වනු ලබන්නේ,

(1) භංගුරතාව නමිනි. (2) විලයනීයතාව නමිනි.

(3) විරූපණය නමිනි. (4) තන්‍යතාව නමින් වේ.

14. යම්කිසි ද්‍රව්‍යයක භෞතික ගුණයක් ලෙස දැක්විය හැක්කේ,

(1) බර (2) ද්‍රවාංකය

(3) තාපාංකය (4) විද්‍යුත් සන්නායකතාවය

15. ප්‍රථම කෝණ ප්‍රක්ෂේපණයේ සංකේතය වන්නේ,

(1)  (2)  (3)  (4) 

16. ලී ඉරීමේදී කියත ලීය තුළ සිරවීම වැළැක්වීමට කියත් දත් වමට හා දකුණට නවනු ලැබේ. ඒ සඳහා භාවිත කරන ආවුදය / උපකරණය වන්නේ,

(1) පොදු අත් අඬුව (2) උල් අඬුව

(3) කපන අඬුව (4) තෙත්තියම් අඬුව

17. ඇඹරුම් විදුම් කටුවක මුවහත් තැබීමේ කෝණය,

(1) 87° කි. (2) 60° කි. (3) 118° කි. (4) 35° කි.

18. ලීයක යතුගාන ලද පැත්තකට, හුලහකට හෝ දාරයකට සමාන්තරව රේඛාවක් ඇඳ ගැනීමට භාවිතා කරයි.

(1) ස්වායමට්ටම් ලෑල්ල (2) වරක්කලය

(3) ලඹය (4) අඳින පිහිය

19. කොන්ක්‍රීට් මිශ්‍රණයක අනුපාතය 1 : 3 : 6 (40) ලෙස දක්වා ඇත. එම මිශ්‍රණය වඩාත් සුදුසු වන්නේ,

(1) කුළුණු සඳහා යෝග්‍ය වේ. (2) බාල්ක සඳහා යෝග්‍ය වේ.

(3) ගෙබිම ඇතිරීම සඳහා යෝග්‍ය වේ. (4) ලින්ටල් සඳහා යෝග්‍ය වේ.

20. පරිවර්තනය කරන ලද දැව ක්‍රමවත් ලෙස ගබඩා නොකිරීම නිසා ඇතිවන දෝෂයකි.

(1) හරඬුව (2) ගැටය (3) ඇඹරීම (4) තරු පලුද්ද

21. කොන්ක්‍රීට් නිෂ්පාදනයක බැහුම් පරීක්ෂාව සිදු කිරීමේදී බැහුම් කේතුවේ උසින් එක්වරකට පිරවිය යුත්තේ,

(1) 1/3 කි. (2) 1/4 කි. (3) 1/5 කි. (4) 1/2 කි.

22. බිත්තියේ සිරස්බව හෙවත් ලම්බක බව පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වේ.

(1) ලෙවල් බටය (2) ලඹය (3) මට්ටම් ලීය. (4) කුස්තානය

23. දැව කොටස්වල දිග වැඩි කිරීමට යොදන මූට්ටුවකි.

(1) හේත්තු මූට්ටුව (2) පලු මූට්ටුව

(3) තට්ටු මූට්ටුව (4) කිඹුල්තල්ල (කයිනොක්කු) මූට්ටුව

24. ආරුක්කුවක කවයේ මුදුනේ හරි මැදින් තබන ගඩොල හඳුන්වන නම කුමක්ද?

(1) කී ගල (2) නැග්ම (3) පරායනය (4) කුළු සැව්ව

25. ලීයක වෘත්තාකාර මුල්ලක් සුමට කරගැනීමේ අවශ්‍ය වේ.

(1) නියන (2) කියත (3) යත්ත (4) රාස්පය

26. වැලි කඩදාසි (නිමැදුම් කඩදාසි) කීපයක ග්‍රිට් අංක 40, 60, 80, 120 ලෙස සඳහන්ව තිබුණි. මෙහි ඇති සිනිඳුම වැලි කඩදාසිය වන්නේ ග්‍රිට් අංක,

(1) 40 වේ. (2) 60 වේ. (3) 80 වේ. (4) 120 වේ.

27. දැව සඳහා යම් ආලේපනයක් ලෙස භාවිතා කිරීම සුදුසු වන්නේ,

(1) කැටලොයි පේස්ට් (2) පොටි

(3) ඇලුමිනියම් සීලර් (4) ලාක්ෂා

28. කපරාදු කිරීමේදී අනුගමනය කරනු ලබන පියවර 4 ක් පහත සඳහන් කර ඇත. එම පියවරයන් අතරින් පළමු පියවර විය යුතු වන්නේ,

(1) මාල අතර පිරවීම. (2) කපරාරු හැන්දෙන් මැදීම.

(3) මනිස් ලෑල්ල භාවිතයෙන් මට්ටම් කිරීම. (4) කැට තැබීම.

29. පහත සඳහන් ගඩොල් කොටස හඳුන්වන නම කුමක්ද?



(1) මා බන්දුව

(2) ගඩොල් 3/4

(3) ආන බාන්දුව

(4) ගඩොල් 1/2

30. පහත රූපයේ දැක්වෙන කුස්තර බේරීමේ ක්‍රමය හඳුන්වන නම වනුයේ,



(1) පැතලි මූට්ටුව

(2) නිකේත මූට්ටුව

(3) මුවවිට මූට්ටුව

(4) යතුරු මූට්ටුව

31. අභ්‍යන්තර දිග හා පළල 6 m x 6 m වූ කාමරයක බිම ඇතිරීම සඳහා 12" x 12" ප්‍රමාණයේ බිම් ගඩොල් කීයක් අවශ්‍ය වේ ද?

(1) 400 (2) 200 (3) 100 (4) 300

32. මෙම රූපයේ දැක්වෙන දැව දෝශය කුමක් ද?



(1) අරටු පලුද්ද (2) තරු පලුද්ද
(3) අඩ වට පලුද්ද (4) වට පලුද්ද

33. කෘමි සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා මඩෙහි ගිල්වා තබා සංරක්ෂණය කර ගන්නා දැවයකි.

(1) අඹ (2) කලුවර (3) කොස් (4) තේක්ක

34. රාජ්‍ය දැව සංස්ථාවේ වර්ගීකරණය අනුව සුපිරි සුබෝපභෝගී පංතියට අයත්වන දැවයකි.

(1) පලු (2) තේක්ක (3) බුරුත (4) කොස්

35. දැව කඳක එළය පිහිටා ඇත්තේ,

(1) අරටුව මැදිගරගෙන ය. (2) දිය පට්ටය හා අරටුව අතරිනි.
(3) පිට පොත්ත හා දියපට්ටය අතරිනි. (4) ඇතුළු පොත්ත හා දිය පට්ටය අතරිනි.

36. ඒක බීජ පත්‍රී ශාකයක දක්නට නොමැති ලක්ෂණයකි.

(1) පත්‍ර පටුව හා දික්ව පිහිටීම. (2) පත්‍ර නාරටි සමාන්තර වීම.
(3) ඇටුවම දක්නට ලැබීම. (4) තන්තු මුල් මගින් තද පොළවට සම්බන්ධ වීම.

37. ගඩොල්වල ඇති දෝෂ අතරට දම් පැහැයෙන් යුතු ගඩොල් ද අයත් වේ. ඊට හේතුව වන්නේ,

(1) අඩුවෙන් පිළිස්සීම (2) ආස්තරික සහිත වීම.
(3) පලුදු තිබීම. (4) වැඩියෙන් පිළිස්සී තිබීම.

38. සියුම් සමාහාර වෙන්කර ගැනීමේදී හලා ගන්නා දැලෙහි සිදුර කුමන අගයකින් යුක්ත විය යුතුදඃ

(1) 4.8 mm (2) 4.5 mm (3) 4.7 mm (4) 4.6 mm

39. රූපයේ දැක්වෙන කියත හඳුන්වන නම කුමක්ද?



(1) අත් කියත (2) තහඩු කියත
(3) බණ්ඩි කියත (4) යකඩ කපන කියත

40. මෙම උපකරණය හඳුන්වන නම වනුයේ,



(1) රැචට් බුරුමය
(2) අවගාරය
(3) තහඩු කියත
(4) දුනු කියත

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 11 - 2023

## නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය - II

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමි වේ.

(01) වස්තුවක සාමාංශක පෙනුමක් පහත රූපයේ දක්වා ඇත.




(i) ඉහත සමාංශක රූපයට අනුව,

A ඊතලය දෙසින් බලා ඉදිරි පෙනුමද,

B පැති පෙනුමද,

C සැලැස්ම ද,

ඍජු ප්‍රක්ෂේපණ මූල ධර්ම අනුගමනය කරමින් තෙවන කෝණ ක්‍රමයට අඳින්න. භාවිත කළ යුතු පරිමාණය 1 : 1 විය යුතුය.

(ii) අරය 3cm ක් වූ වෘත්තයක් නිර්මාණය කොට පරිධියේ එක් ස්ථානයක් P ලෙස නම්කොට එම ස්ථානට ස්පර්ශකයක් නිර්මාණය කරන්න.

(02) (i) ස්වභාවික දැව යනු මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) දැවවල පවත්නා ස්වභාවික ගුණාංග තුනක් නම් කරන්න.

(iii) ද්විබීජ පත්‍රී ශාකයක දක්නට ඇති බාහිර ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.

(iv) ''හරඩුව'' යනු දැව දෝෂයකි. ඉන් දැවයට විය හැකි හානිය කුමක් ද?

(03) ''ඉදිකිරීම් කටයුතු සඳහා අතීතයේ සිටම ගඩොල් භාවිත කිරීම දක්නට ඇත.''

(i) ලංකාවේ ගඩොල් කර්මාන්තයක් ලෙස ප්‍රසිද්ධ වී ඇති ප්‍රදේශ 04 ක් නම් කරන්න.

(ii) ගඩොල්වල දැකිය හැකි දෝෂ 4 ක් නම් කරන්න.

(iii) වරිතුනක පමණ බඩගල් බැම්මක කොටසක් ඇඳ එහි හෝණ කුස්තුරය, බඩ ගල්වරිය, සිරස් කුස්තුරය නම් කර පෙන්වන්න.

(iv) ගඩොල් සඳහා භාවිතට ගත හැකි ආදේශක 2 ක් නම් කරන්න.

(04) ''වර්තමානයේ ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ කොන්ක්‍රීට් භාවිතය බහුලව දැක ගත හැක.''

(i) කොන්ක්‍රීට් සකස්කරනු ලබන්නේ කෙසේද?

(ii) කොන්ක්‍රීට් සුසංහසනය නොකිරීම නිසා ඇතිවන අවාසි තුනක් සඳහන් කරන්න.

(iii) කොන්ක්‍රීට්වල බැහුම් පරීක්ෂාව සිදුකරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(05) (i) ආවුද හා උපකරණ යනු මොනවාදැයි උදාහරණ සහිතව වෙන වෙනම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) භාවිතයෙන් ඉවත් වෙමින් පවතින ආවුද 4 ක් නම් කරන්න.

(iii) ඉහත (ii) පිළිතුරෙහි සඳහන් ආවුද/උපකරණවල රූප සටහනක් ඇඳ එහි නම සඳහන් කරන්න.

(iv) නිවැරදි පිරිවිතර අනුව ආවුද/ උපකරණ තෝරා ගැනීමෙන් ලැබෙන වාසි 4 ක් සඳහන් කරන්න.

(06) (i) නිෂ්පාදනය කර ඇති ආකරය අනුව ඇණ වර්ග මූලික වශයෙන් කොටස් තුනකට බෙදේ. ඒවා නම් කරන්න.

(ii) ඇණ තැබීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 3 ක් සඳහන් කරන්න.

(iii) කැඩීගිය ඇණයක් ගලවා ගැනීමට සුදුසු ආවුදයක් නම් කරන්න.

(iv) ඉස්කුරුප්පු ඇණයක කොටස් පහත රූපයේ දැක්වේ. ඒවා නම් කරන්න.




(07) (i) ගේබියන් රැඳවුම් බිත්ති නිර්මාණය කර ගන්නා ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(ii) ගේබියන් බිත්ති යොදාගන්නා අවස්ථා 3 ක් සඳහන් කරන්න.

(iii) ගේබියන් බිත්ති භාවිතයේ වාසි තුනක් ලියන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (1) | 11 - (1) | 21 - (1) | 31 - (1) |
| 2 - (2) | 12 - (3) | 22 - (2) | 32 - (4) |
| 3 - (2) | 13 - (2) | 23 - (4) | 33 - (1) |
| 4 - (3) | 14 - (1) | 24 - (1) | 34 - (1) |
| 5 - (1) | 15 - (1) | 25 - (4) | 35 - (2) |
| 6 - (2) | 16 - (4) | 26 - (4) | 36 - (3) |
| 7 - (3) | 17 - (3) | 27 - (3) | 37 - (4) |
| 8 - (4) | 18 - (2) | 28 - (4) | 38 - (1) |
| 9 - (3) | 19 - (3) | 29 - (1) | 39 - (3) |
| 10 - (1) | 20 - (3) | 30 - (1) | 40 - (1) |

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

## II කොටස

(01)




A ඉදිරි පෙනුම
ආනත රේඛාවට ල.1
මධ්‍ය සිරස් රේඛාවට ල.1
තිරස් රේඛාවට ල.1
වට රේඛාවට ල.1
04

C සැලැස්මට
මැද තිරස් රේඛාවට ල.1
නියමිත වටේ රේඛාවට ල.2
කට්ට කොටස ල.1
04

B පැති පෙනුම
සිරස් රේඛාව ල.1
තිරස් රේඛාව ල.1
වටේ රේඛාව ල.1
03

පොදු කරුණු
නිවැරදි මිම් ල.1
පිරිසිදු බව ල.1
තෙවන කෝණ ක්‍රමය
ඇඳීමට ල.2
04




අරය 3 cm වෘත්තයට ඇඳීමට ල.2
P හා කේන්ද්‍රය යාකොට රේඛාව ඇඳීම ල.1
ස්පර්ෂකය ඇඳීමට ල.2
05

(02) (i) ස්වභාවයෙන් පවත්නා ගස්වල කද සහ අතු පරිවර්තනය කිරීමෙන් ලබාගන්නා දැව ස්වභාවික දැව වේ.(ල. 2)

(ii)
- ශක්තිය
- කල්පැවැත්ම
- දෘඩිබව
- නැමෙන සුළු බව
- අලංකාරය

(ල. 3)

(iii)
- ප්‍රධාන කඳෙන් අතු බෙදීම.
- පළල් පත්‍ර හෝ ඉති සහිත සිහින් පත්‍ර පිහිටීම.
- පත්‍ර නාරටි දැලක ආකාරයෙන් යුක්ත වීම.
- බීජ පත්‍ර පියළි දෙකකින් යුක්ත වීම.
- ඇටුවම දක්නට ලැබීම.

(ල. 2)

(iv) හරඹුව පිහිටි ස්ථානයෙන් දැවය පිපිරී හෝ කැඩී යාමට පුළුවන (ල. 3)

(03) (i) බංගදෙණිය, දංකොටුව, කොටදෙණියාව, කොච්චිකඩේ, හංවැල්ල, මහියංගනය, මාතර, පොලොන්නරුව, අනුරාධපුරය (ල. 2)

(ii) නියමිත මිනුම්වලට නොතැබීම, වැඩියෙන් පිළිස්සුන ගඩොල්, අඩුවෙන් පිළිස්සුන ගඩොල්, ආස්තරික ගඩොල්, පලුදු සහිත ගඩොල් (ල. 2)

(iii)




(ල. 3)

(iv) සිමෙන්ති පස් මිශ්‍රිත සම්පීඩිත ගඩොල්
සිමෙන්ති බ්ලොක් ගල් (ල. 3)

(04) (i) පළමුව සියුම් සමාහාර හා බැදුම් ද්‍රව්‍ය ඒකාකාරී වර්ණයක් ලැබෙනසේ මිශ්‍රකර වේදිකාවක් මත තුනී තට්ටුවක් වනසේ අතුරයි. ඒ මත රළු සමාහාර අතුරා අවශ්‍ය පමණට ජලය එකතු කොට මිශ්‍ර කිරීම සිදුකරනු ලබයි. හොඳින් මිශ්‍ර කිරීමෙන් අනතුරුව කොන්ක්‍රීට් මිශ්‍රණය සකස්කරගනු ලබයි. (ල. 3)

(ii) හිඩැස් ඇතිවීම හේතුවෙන් කොන්ක්‍රීට් නිමවුමේ ශක්තිය අඩුවීම.
වැර ගැන්වූ ද්‍රව්‍ය අතර හා කොන්ක්‍රීට් අතර සම්බන්ධය අඩුවීම.
බාහිරව පෙනෙන මී වද වැනි කුඩා සිදුරු නිසා අවලස්සන වීම. (ල. 3)

(iii) නිවැරදි පිළිතුරට (ල. 4)

(05) (i) ආවුද යනු :- කැපීමෙන් කොටස් වෙන් කිරීම සඳහා භාවිතා කරන දෑ වේ. උදා:- කියත, නියන (ල. 1)
උපකරණ :- කැපීමක් සිදුනොවන අවස්ථාවල භාවිතා වන දෑ උපකරණ ලෙස හඳුන්වයි.
උදා:- මුළු මට්ටම, වැද්දුම් කරාමය, ලඹය. (ල. 1)

(ii) අවගාරය, දුනු කියත, රැඩට් බුරුමය, තහඩු කියත, තට්ටු යත්ත (ල. 2)

(iii) නිවැරදි පිළිතුරට (ල. 3)

(iv) කාරිය නිවැරදිව කළ හැකි වීම, කාලය ඉතිරි වීම, කාරිය වඩාත් පහසු වීම, අනතුරු වැලකීම. (ල. 3)

(06) (i) කම්බි ඇණ, ඉස්කුරුප්ප ඇණ, මුරිච්චි හා බදුත (ල. 3)

(ii)
- අවශ්‍ය ප්‍රමාණයේ ඇණ තෝරා ගැනීම.
- ඇණ තැබීමේදී තරමක් ඇදට ඇණ තැබීම.
- ඇණ කදේ මහතට තරමක කුඩා සිදුරක් විදගැනීම.
- ඇණ තුඩට සබන් වැනි ලිහිසි ද්‍රවයක් ගැල්වීම.
- ඇණ තුඩ මොටකර තැබීම. (ල. 2)

(iii) ඩැහි අඬුව. (ල. 2)

(iv) A ඇණ කට්ටය　B ඇණ හිස
C ඇණ කද　D ඇණ පොට (ල. 2)

(07) (i) ගැල්ව නයිස්කල යකඩ කම්බි හෝ PVC ආවරණය කළ ලෝහ කම්බි එකිනෙක වටා අඹරවමින් වියාගන්න ලද කම්බි දැලක් උපයෝගී කොටගෙන හතරැස් හෝ රවුම් ගේබියන් කුඩුව තුළට කැබලි කරන ලද කලුගල් කොටස් ඇසිරීමෙන් සකස් කර ගනී. (ල. 2)

(ii)
- ගංගා ආශ්‍රිතව බැම් කඩා වැටීම වැලැක්වීම සඳහා
- මුහුදු ආශ්‍රිතව සිදුවන මුහුදු ඛාදනය වැලැක්වීම සඳහා
- මායිම් තාප්ප නිර්මාණය සඳහා
- ගොඩනැගිලි නිර්මාණය සඳහා (ල. 3)

(iii)
- බැම්ම හරහා පහසුවෙන් ජලය ගලායාම.
- ඉදිකිරීම් කටයුතු පහසු වීම.
- පරිහරණය හා ප්‍රවාහනය පහසු වීම.
- සෝදාපාළුව වැලැක්වීම. (ල. 2)